**ශීර්ෂය 118 - කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගණුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශිර්ෂය 118 - කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛණ, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 26 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.18 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුලත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127(1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරු වන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කල යුතුවීම. | 1. ක්‍රියාකාරි සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම | 2.2.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.3.1 |
| | | 3. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.11 (අ) (ආ) |
| | | 4. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.13 |
| | | 5. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.15 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය අදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අවිධිමත් ගණුදෙනු | 2.6 |
| | | 2. කළමනාකරණ අඩුපාඩු | 2.8 |
| | | 3. විසදා නොතිබුණු විගණන ඡේද | 2.7 |

| | | | |
|---|---|---|---|
| | | 4. අනුකූල නොවීම් | 2.16 |
| | | 5. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.17 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අලුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.2.3 |
| | | 2. කාල පමාවකින් පසු වැඩ ආරම්භ කළ ව්‍යාපෘති | 2.2.5(අ) |
| | | 3. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටු නොවීම | 2.2.7 |
| | | 4. විදේශාධාර ව්‍යාපෘති නියමිත දිනයට ආරම්භ නොකිරීම | 2.2.5 (ආ) |
| | | 5. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.2 |
| | | 6. අනාර්ථික ගණුදෙනු | 2.6 |
| | | 7. මුදලට අගය විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු | 2.9 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියාකළ හැකිවන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වන ආකාරයක් සලසා තිබීම | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.4(අ) |
| | | 2. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවැතීම | 2.4 (ආ) |
| | | 3. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම | 2.4 (ඇ) |
| | | 4. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම් | 2.4 (ඇ) |

| | | | | |
|---|---|---|---|---|
| | | | 5. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ දුර්වලතා | 2.10 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විවිධ වූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ෂණයට භාජනය කිරීම. | 1 | 1. වාර්ෂික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් නොකිරීම | 2.2.6 |
| | | | 2. වාර්ෂික අයවැය සීමා ඉක්මවා බැදීම්වලට එළඹීම | 2.5.1 |
| | | | 3. අග්‍රිම ගිණුමේ අඩුපාඩු. | 2.13 |
| | | | 4. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු. | 2.14 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම් අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම. | 2.11 (අ) |
| | | | 2. අධි ප්‍රතිපාදන සලසා තිබීම. | 2.11 (ආ) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම. | | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු. | 2.12 |
| 127(7) | නිලධාරින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වූ අවස්ථාවලදි මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියමකර ඇති කාර්යය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/ සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන | | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.18 |

ලද්දේ නම් තමා වෙත පැවරි ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම්කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහායවීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරි භාරයක්වීම.

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයන්

--------------------------------------

කෘෂිකාර්මික අංශයේ සංවර්ධන කටයුතු උදෙසා ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම හා පහසුකම් සැලසීමත්, අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට ප්‍රතිපත්තිමය මඟපෙන්වීම ලබා දීම හා පරිපාලන කටයුතු, කාර්යසාධනය අධීක්ෂණය කිරීමත් අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයන් වේ.

### 2.2 කාර්යසාධනය

----------------

#### 2.2.1 සැලැසුම් කිරීම

----------------

අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති දෙපාර්තමේන්තු 02 ක් සහ ව්‍යවස්ථාපිත ආයතන 09 ක හා විදේශ ව්‍යාපෘතියක හා අරමුදල් 02 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු 2017 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 262.70 ක ප්‍රතිපාදන සලසා ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් 02 ක් ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කර නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

### 2.2.2 ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කාර්යභාර්යයන් ඉටු නොකිරීම

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහජනතාවගේ දැනගැනීම සඳහා කෘෂිකාර්මික ප්‍රදර්ශන හා මාධ්‍ය වැඩසටහන් පැවත්වීමේ උපාය මාර්ගයන්ට අදාලව දිස්ත්‍රික්ක මටට්මින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ගොවීන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම සහ විශේෂ සංවර්ධන ව්‍යාපෘතින් යන ක්‍රියාකාරකම් 03 සඳහා රු.මිලියන 50 ක් වෙන්කර තිබුණද, එම ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි.

(ආ) ආකෘති සකස් කිරීම, කාෂිකාර්මික පර්යේෂණ හා නිෂ්පාදන සහයකයින් සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කිරීමේ උපාය මාර්ගයන් ඇතුළු ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය, ආකෘති සකස් කිරීම සහ පුහුණුව ඇතුළු උප ක්‍රියාකාරකම් 04 ක් සඳහා රු.මිලියන 40 ක් වෙන්කර තිබුණද එම ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි.

(ඇ) හෙල බොජුන් මධ්‍යස්ථාන මඟින් දේශීය ආහාර ප්‍රවර්ධනය කිරීම හා කාන්තාවන් බලගැන්වීම සහ ප්‍රධාන පළතුරු බෝගයන්ගේ ඵලදායිතාවයට අදාල හැසිරීම අධ්‍යනය කිරීම යන උපාය මාර්ගයන්ට අදාලව කාර්යයන් 08 ක් ඉටුකිරීම සඳහා රු.මිලියන 4.42 ක් වෙන්කර තිබුණද එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඈ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා රු.මිලියන 20 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම කාර්යය ඉටුකර නොතිබුණි.

### 2.2.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

---------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 3,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන මත කුඩා වැව් 1,500 ක් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීමේ උපායමාර්ගය යටතේ ක්‍රියාකාරකම් 09 ක් සඳහා රු.මිලියන 1,938.40 ක වියදමකින් ලබාගෙන තිබුණු ප්‍රගතිය සියයට 5 සිට සියයට 71 ක දක්වා වූ පරාසයක පැවතුණි.

(ආ) පුරන්කුඹුරු යලි වගා කිරීමේ උපායාමාර්ග යටතේ කුඹුරු හෙක්ටයාර 2,344 ක විශේෂ පාංශු ගැටළු පුනරුත්ථාපනයට රු.මිලියන 5.8 ක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1.9 ක් වැය කර කුඹුරු හෙක්ටයාර 378 ක් හෙවත් සියයට 16 ක ප්‍රමාණයක පමණක් අදාල කාර්යය ඉටු කර තිබුණි.

(ඇ) රු.මිලියන 13 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන මත හෙල බොජුන් මධ්‍යස්ථාන මඟින් දේශීය ආහාර ප්‍රවර්ධනය කිරීම හා කාන්තාවන් බලගැන්වීමේ උපායමාර්ග යටතේ නව හෙල බොජුන්හල් 03 ක් හලාවත, ත්‍රිකුණාමලය හා බෙලිගම යන ප්‍රදේශවල ස්ථාපනය කිරීම ඇතුළු එම ප්‍රදේශවල ව්‍යවසායකත්ව හැකියාව සංවර්ධනයට අදාල පුහුණු කිරීම් හා දැනුවත් කිරීම් ඇතුළු උප ක්‍රියාකාරකම් 05 ක ප්‍රගතිය සියයට 20 සිට සියයට 46 ක් දක්වා වූ පරාසයක පැවතුණි.

(ඇ) කෘෂිකාර්මික ප්‍රදර්ශන හා මාධ්‍ය වැඩසටහන් පැවැත්වීමේ උපාය මාර්ගයන්ට අදාලව ගොවිපලවල්, පර්යේෂණ මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ප්‍රදර්ශන පැවැත්වීමේ උප ක්‍රියාකාරකම යටතේ ගොවිපලක් සංවර්ධනය කිරීමට හා ප්‍රදර්ශන 03 ක් පැවැත්වීමට රු.මිලියන 35 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ඉන් රු.මිලියන 4.67 ක් වැයකර එක් ප්‍රදර්ශනයක් පමණක් පවත්වා තිබුණි.

(ඉ) රු.මිලියන 9.16 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන මත සන්දනංකුලම ග්‍රාමයේ ලොකු ළූණු නිෂ්පාදන ගම්මානයක් ලෙස සංවර්ධනය කිරීම යන උපාය මාර්ගයට අදාලව ලොකු ළූණු බීජ ලබා දීම, වගා ළිං ඉදිකිරීම, වතුර පොම්ප ලබාදීම සහ ක්ෂුද්‍ර ජල පද්ධති ලබා දීම, ලොකු ළූණු මව් බල්බ හා පොලිතීන් ලබා දීම හා ගබඩා ඉදිකිරීම සහ කාබනික පොහොර කැබලි කිරීමේ යන්ත්‍රයක් ලබා දීම යන උප ක්‍රියාකාරකම් 07 කින් රු.779,300 ක් වැයකර ලොකු ළූණු බීජ ලබා දීම සහ කාබනික පොහොර කැබලි කිරීමේ යන්ත්‍ර ලබාදීම යන උප ක්‍රියාකාරකම් දෙක පමණක් සිදුකර තිබුණි.

(ඊ) ඊ - කෘෂිකර්මය සඳහා භාණ්ඩ මිලදී ගැනීමට ප්‍රසම්පාදන සැලැස්මේ රු.මිලියන 160 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා වැයකර තිබුණේ රු.මිලියන 17.38 කි.

## 2.2.4 ඉටු නොකළ ව්‍යාපෘති

-----------------------

මාතලේ දිස්ත්‍රික්කයේ රු.මිලියන 23.26 ක ඇස්තමේන්තු මත ප්‍රතිසංස්කරණය කළ යුතු දඹුල්ල, කිඹිස්ස, පල්ලේපොළ, ගලේවෙල, දේවහුව, යන ගොවිජන කාරක සභා බල ප්‍රදේශ තුළ වැව් 11 ක සුළු වාරි ප්‍රතිසංස්කරණ කටයුතු ඉටුකර නොතිබුණි.

## 2.2.5 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

---------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජපන් රජය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපාර්ශවීය අරමුදල හරහා ජාතික ශාක නිරෝධායන සේවයෙහි තාක්ෂණ උපකරණ අළුත්වැඩියාව සහ පුනරුත්ථාපනයට 2016 වර්ෂයේදී රු.මිලියන 259.69 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර, අදාල කටයුතු ආරම්භකර තිබුණේ 2018 වර්ෂයේදී ය.

(ආ) කෘෂිකර්ම අංශයේ නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකු ආධාර යටතේ රු.මිලියන 9,553.78 ක ණය මුදලක් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ලබා දී තිබුණි. එම ව්‍යාපෘතිය 2016 ඔක්තෝබර් 15 දින ආරම්භ කිරීමට නියමිතව තිබුණද, ව්‍යාපෘතියේ වැඩ ආරම්භකර තිබුණේ 2017 මාර්තු 22 දින දීය.

## 2.2.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, මුදල් වර්ෂය අවසාන වී දින 220 කින් එනම් 2018 අගෝස්තු 09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

## 2.2.7 විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්ය සාධනය

කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාව හා විවිධාංගීකරණය වැඩිකර ගැනීම සඳහා ගොවි පුහුණු ධාරිතා වර්ධනය, කෘෂිකාර්මික තාක්‍ෂණික ආදර්ශන උද්‍යානය සකස් කිරීම, නිෂ්පාදන හා අලෙවි යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ අදාළ කටයුතු සඳහා උපදේශක සහයන් ලබා ගැනීමේ අරමුණ ඇතිව 2017 මාර්තු 22 දින ආරම්භ කළ කෘෂිකර්ම අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 700 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර, ඉන් රු. මිලියන 81.04 ක් කාර්යය මණ්ඩලය බඳවා ගැනීම, ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම, අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සහ උපදේශන ගාස්තුව සඳහා වැය කිරීම හැර ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීමට අදාළ අනෙකුත් වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි.

# 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයුම් හා සේවා ලබා ගැනීම

## 2.3.1 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයුම් හා සේවා ඉටුකර ගැනීම සඳහා රු.මිලියන 2,272.22 ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 486.57 ක් උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශය පවත්වාගෙන යාමට කුලියට ගත් ගොඩනැගිල්ලක අභ්‍යන්තර කාමර බෙදා වෙන් කිරීම, බුමුතුරුණු ඇතිරීම, විදුලි හා වායු සමීකරණ කටයුතු සිදු කිරීම, ගෘහ භාණ්ඩ සපයා සවි කිරීම හා තොරතුරු පද්ධති සැපයීම සඳහා රු.මිලියන 260.85 ක් වැයකර තිබුණු අතර, මෙම වියදම ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා නොතිබුණි.

## 2.3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) කෘෂිකර්ම අමාත්‍යාංශය, බත්තරමුල්ල ප්‍රදේශයේ පුද්ගලික ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම සඳහා කාමර බෙදා වෙන් කිරීම, බුමුතුරුණු ඇතිරීම, විදුලි කටයුතු හා වායු සමීකරණ කටයුතු, ගෘහ භාණ්ඩ මිලට ගැනීම හා තොරතුරු තාක්ෂණ පද්ධති සැපයීම සඳහා රු.මිලියන 260.85 ක් වැය කර තිබුණු අතර, මේ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 1.2.1(ඇ) මාර්ගෝපදේශය පරිදි සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගීවීම සඳහා සමාන හා උපරිම අවස්ථා ලබාදීය යුතු බව සඳහන්ව ඇතත්, කාර්යාල

ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේදී හා තොරතුරු තාක්ෂණ පද්ධති සපයා ගැනීම සඳහා පල කළ පුවත්පත් දැන්වීම්වල පිළිවෙලින් රු.මිලියන 140 ක සහ රු.මිලියන 80 ක ණය පහසුකම් අයදුම් කිරීමට ලංසුකරුට යෝග්‍යතාවය තිබිය යුතු බවට කොන්දේසි ඇතුළත් කර තිබීම හේතුවෙන්, ඇතැම් ලංසුකරුවන්ට මිල ගණන් ඉදිරිපත් කිරීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ii) කාර්යාල ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේදී රු.75.35 ක අඩු මිල ඉදිරිපත් කල ලංසුකරු වර්ෂ 05 ක වගකීම් කාලයක් ලබා දී තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුව අදාල අවශ්‍යතාවය සපුරා නොමැති බව සඳහන් කර තිබුණු අතර, ලංසු ලේඛනයේ පරිච්ඡේද අංක 03 යටතේ ඉල්ලා ඇති පිරිවිතරයන්ට එකඟ නොවන බව සඳහන් කර තිබුණද එකඟ නොවන පිරිවිතර මොනවාද යන්න තාක්ෂණික ඇගයීම් කමිටුව නිශ්චිතව සඳහන් නොකර ලංසුව ප්‍රතික්ෂේප කිරීම නිසා රු.මිලියන 31.42 ක වැඩි පිරිවැයක් දරා අදාල ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට සිදු වී තිබුණි.

(iii) ඇස්තමේන්තුව අනුව කාමර බෙදා වෙන් කිරීම සඳහා භාවිතා කල යුතු වන්නේ HDF (High Density Fiber) වන අතර, කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම මත Particle Board යොදන ලෙස ඉංජිනේරු ඇස්තමේන්තුවේ අදාළ සංශෝධනයන් කර තිබුණත්, Particle Board ද භාවිතා නොකර කොන්ත්‍රාත්කරුවන් භාවිතා කර තිබුණේ MDF (Medium Density Fiber Board) බව නිරීක්ෂණය විය.

(iv) ගොඩනැගිල්ලේ යථෝක්ත ඉදිකිරීම් ගිවිසුම් දිනට ඉටු කිරීමට කොන්ත්‍රාත්කරුවන් අපොහොසත් වීම හේතුවෙන් අදාල ප්‍රමාද කාලයන් සඳහා ගිවිසුම අනුව කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගත යුතු රු.මිලියන 17 ක ප්‍රමාද දඩ අයකර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඇ.ඩො. 23,572,800 ක වියදමින් යූරියා පොහොර මෙ.ටොන් 72,000 ක් ආනයනය කර තිබුණු අතර, මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) 2017 යල කන්නය සඳහා යූරියා (ග්‍රිල්ඩ්) මෙ.ටොන් 18,000 ක් ලියාපදංචි සැපයුම්කරුවන්ගේ මිල ගණන් මත ප්‍රසම්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද, පසුව රජයේ පොහොර සමාගම් සභාපතිවරුන්ගේ යෝජනාවකට අනුව ලේඛන මත ගෙවීම් කෙරෙන (DA Terms) විවෘත ජාත්‍යන්තර මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට තීරණය කර තිබුණි.

(ii) 2017 නොවැම්බර් 09 දින පල කළ පුවත්පත් දැන්වීමකට අනුව යූරියා මෙ.ටොන් 72,000 ක් මිලදී ගැනීමට ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් යටතේ ලංසුකරුවන්ට ආරාධනා කර තිබුණු අතර, පුවත්පත් දැන්වීමට අනුව ලේඛන මත ගෙවීම් කෙරෙන ක්‍රමය අනුගමනය කළ යුතු බවට කොන්දේසි පැනවීම හේතුවෙන් මිල තරඟය සීමාවී තිබුණි.

(iii) මේ නිසා එක් දේශීය ලංසුකරුවෙකුගෙන් පමණක් මිල ගණන් ලැබී තිබුණු අතර එම ලංසුකරු ලවා අදාළ පොහොර තොගය ආනයනය කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. නමුත් පසුව මෙම කොන්ත්‍රාත්කරු විසින් ලබා දෙන ලද ව්‍යාජ රසායනාගාර වාර්තාවක් හේතුවෙන් අදාළ පොහොර

ආනයනය අත්හිටුවීමට තීරණය විය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13(ඇ) මාර්ගෝපදේශය පරිදි මෙම ලංසුකරුගේ ඇ.ඩො 240,000 ක ලංසු සුරක්ෂණය රාජසන්තක කිරීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් දිවයින පුරා දැඩි පොහොර හිඟයක් උද්ගත වී තිබුණි.

(iv) 2017 දෙසැම්බර් 05 දින ලද අමාත්‍ය මණ්ඩල තීරණය හා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ නිරීක්ෂණ මත 2017 දෙසැම්බර් 11 දින රැස්වූ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව මඟින් යූරියා (ප්‍රිල්ඩ්) මෙ.ටො. 36,000 ක් ගෙන්වීම සඳහා Agri Commodities Finance FZE ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමට සූදානම් කර තිබූ අවස්ථාවේ කිසිදු හේතුවකින් තොරව එදිනම සවස රැස්වූ අමාත්‍ය මණ්ඩල විශේෂ ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම කොන්ත්‍රාත්තුව අවලංගුකර තිබුණි.

(v) එදිනම යූරියා මෙ.ටො. 72,000 ක් ගෙන්වීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කර තිබූ සාවද්‍ය කරුණු මඟින් අමාත්‍ය මණ්ඩලය නොමඟ යැවීමට කටයුතු කර තිබූ අතර, එම අමාත්‍ය මණ්ඩල සංදේශයේ 1 හා 2 යන ඡේද සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමට යටත්ව අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී තිබුණද එසේ මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.

(vi) මෙම අවස්ථාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව යමින් මෙ.ටො. 1 ක් ඇ.ඩො. 316.20 කට යූරියා (ප්‍රිල්ඩ්) මෙ.ටො. 36,000 ක් ගෙන්වීමට තෝරාගත් සැපයුම්කරු වෙතම මෙ.ටො. 1 ක් සඳහා ප්‍රිල්ඩ් යූරියා මිලටම යූරියා ග්‍රැනියුලා මෙ.ටො. 72,000 ක් ගෙන්වීම සඳහා ඇග්‍රි කමොඩිටීස් ෆිනෑන්ස් ආයතනය වෙතම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඒ අනුව රටේ යූරියා අවශ්‍යතාවයට වඩා මෙ.ටො.36,000 ක් ගෙන්වීම නිසා දළ වශයෙන් රු.මිලියන 1,764 ක වටිනා පොහොර වැඩිපුර ආනයනය කර තිබුණි.

(vii) 2017 දෙසැම්බර් 14 දින ග්‍රැනියුලා යූරියා වල නැව තෙක් මිල (FOB) ඇ.ඩො 206 -240 ක් වූ අතර ප්‍රවාහන හා අනෙකුත් වියදම් සඳහා ඇ.ඩො 30 ක් වියදම් වී ඇති බැවින් මෙ.ටො. 1 ක උපරිම මිල දළ වශයෙන් ඇ.ඩො 270 ක් විය යුතුය. නමුත් කොන්ත්‍රාත්කරු සමඟ මෙ.ටො 1 ක් ඇ.ඩො. 316.20 බැගින් ගෙන්වීමට එකඟ වීම මඟින් මෙ.ටො 72,000 ක් සඳහා දළ වශයෙන් රු.මිලියන 519.17 ක අධි ගෙවීමක් කිරීමට රජයට සිදුවී තිබුණි.

(viii) 2017 යල කන්නය සඳහා අවශ්‍ය පොහොර කඩිනමින් ලබා ගැනීමට යැයි සඳහන් කරමින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පොහොර ගෙන්වීම සඳහා ඉදිරිපත් කල ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව පොහොර තොගය ගෙන්විය යුතු දිනය දෙසැම්බර් 28 දින ලෙස සඳහන් කර තිබුණද ඉන් දින 10 ට පසුව එනම් 2018 ජනවාරි 08 දින මෙම තොගයෙන් මෙ.ටො.40,500 ක් ලැබී තිබුණු අතර ඉතිරි මෙ.ටො.32,000 ලැබී තිබුණේ 2018 ජනවාරි 15 දින දීය. ඒ අනුව 2017 යල කන්නයේ ගොවීන්ගේ පොහොර අවශ්‍යතාවය නිසි කලට සපුරා ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

-----------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාව

--------------------------------------

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 32.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය භාවිත කල වාහන 66 සඳහාම සමාලෝචිත වර්ෂයේ ඉන්ධන දහනය වීම් පරීක්ෂා කර නොතිබුණි.

### (ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 17.199 ක ඉඩම සහ එහි පිහිටි කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ගොඩනැගිලි සංකීර්ණය සමාලෝචිත වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

**(ii)** ධාවනයෙන් ඉවත් කල ජීප් රථයක් හා යතුරු පැදි 08 ක් නිෂ්කාර්යව පැවති අතර මෙම වාහන අළුත්වැඩියාකර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### (ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

-----------------------------------------

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අමාත්‍යාංශය සතු වාහන 48 ක් විධිමත් පරිදි පවරාදීමකින් තොරව බාහිර ආයතන 16 ක් වෙත ලබා දී තිබුණි.

### (ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

--------------------------------------------------------------

අමාත්‍යාංශය විසින් වෙනත් අමාත්‍යාංශ 05 ක් හා ආයතන 02 ක් සතු එකතුව රු.70,158,373 ක් වටිනා වාහන 15 ක් හා වටිනාකම හෙළිදරව් නොවූ වෙනත් අමාත්‍යාංශ 02 ක් සතු කාර් රථ 06 ක් පවරා ගැනීමකින් තොරව අවිධිමත්ව පරිහරණය කරමින් පවතී.

## 2.5 බැඳීම් හා බැරකම්

--------------------

### 2.5.1 ප්‍රතිපාදනය ඉක්මවා බැරකම් වලට බැඳීම

--------------------------------------------

වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 30,729.4 ප්‍රතිපාදනය සියයට දහයකින් (රු.මිලියන 3,195.7 කින්) ඉක්මවා රු.මිලියන 3,385.6 ක බැඳීම් ඇතිකර ගෙන තිබුණි.

## 2.6 අවිධිමත් ගනුදෙනු

--------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) කුඹුරු පොහොර සහනාධාර මුදල් ගෙවීමට අදාළව නිකුත් කරන ලද 2017 අප්‍රේල් 19 දිනැති අංක NFS/FCG/(4)/2017 යල දරන චක්‍රලේඛය ප්‍රකාරව එක් ගොවියෙකුට කන්නයක් සඳහා ලැබිය යුතු උපරිම සහනාධාර මුදල රු.25,000 කට සීමාකර තිබුණි. තවද වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා පොහොර සහනාධාර මුදල් ගෙවීමට අදාලව නිකුත් කරන ලද 2017 සැප්තැම්බර් 19 දිනැති අංක NFS/FCG/(OFC)/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයක් සඳහා හෙක්ටයාර් එකකට ගෙවිය හැකි උපරිම සහනාධාර මුදල් රු.10,000 කි. ඒ අනුව උපරිම වශයෙන් කුඹුරු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග යන දෙකම වගා කරන ගොවියකුට එක් කන්නයක් සඳහා ලබාගත හැකි උපරිම පොහොර සහනාධාර මුදල් රු.35,000 කි. එසේ වුවද නියැදි පරීක්ෂාවකට අනුව 2017 යල කන්නයේ ගොවීන් 09 දෙනෙකුට එකතුව රු.402,500 ක මුදලක් රු.35,000 උපරිම සීමාව ඉක්මවා ගෙවා තිබුණි.

(ආ) ගොවි සංවිධාන ලියාපදිංචි කිරීමේදී එකඟතාවය පලකර ඇති 1991 අංක 4 දරන ගොවි සංවිධාන ආදර්ශ අතුරු ව්‍යවස්ථාවේ 18 වැනි වගන්තියට අනුව ගොවි සංවිධාන විසින් වාර්ෂිකව නිලධාරී මණ්ඩලයක් පත්කර ගත යුතු බව සඳහන් කර ඇතත්, 2017 වර්ෂය සඳහා නිලධාරි මණ්ඩලයක් පත් නොකළ මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ගොවිජන කාරක සභා බල ප්‍රදේශයේ ගොවි සංවිධාන 4 කට එකතුව රු.9,447,154 ක් වූ කොන්ත්‍රාත් 5 ක් අධිකාරි බලය නොමැතිව පිරිනමා තිබුණි.

(ඇ) කුඹුරු පොහොර සහනාධාර මුදල් ගෙවීමේදී වගා කරනු ලබන කුඹුරු ඉඩම් වෙනුවට අදාළ කන්නවල වගා නොකළ කුඹුරු ඉඩම් සඳහාද පොහොර සහනාධාර මුදල් ගෙවා තිබූ අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව නියැදි පරීක්ෂාවට ලක් කළ දිස්ත්‍රික්ක 16 ක වගා නොකල කුඹුරු ඉඩම් සඳහා ගෙවා තිබූ මුළු සහනාධාර මුදල රු.1,131,723,030 ක් විය.

## 2.7 විසඳා නොතිබුණු විගණන ඡේද

---------------------------------

අමාත්‍යාංශයට අදාලව 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දුන් ඌනතාවයන්ගෙන් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| **විගණකාධිපති වාර්තාවේ ඡේදය** | **යොමුගත විෂයය** |
| --- | --- |
| 3.5.2(අ) | පොහොර මුදල් සහනාධාර ගෙවීමේදී රු.මිලියන 1,237.9 ක සදොස් ගෙවීම්. |
| 3.5.3 | කාබනික පොහොර නිෂ්පාදනය භාවිතය හා දිරිගැන්වීමේ වැඩසටහනේ ප්‍රගතිය. |
| 3.5.6 | කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහනේ පැවති අඩුපාඩු නිවැරදි නොකිරීම. |

3.5.7(ඇ) රු.මිලියන 58 ක වියදමින් සිදු කළ ගම්දොර විශේෂ වැඩසටහනේ අරමුණු අනුව දත්ත පද්ධතියක් සකස් නොකිරීම.

3.7(අ) අදාල පාර්ශව වලින් අනුමැතිය හා උපදෙස් ලබා ගැනීමකින් තොරව අමාත්‍යාංශය සඳහා කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම හා එම ගොඩනැගිල්ලේ අඩුපාඩු නිවැරදි නොකිරීම.

## 2.8 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ කන්න දෙක සඳහා මෙන්ම 2017 යල කන්නය සඳහාද පුද්ගලයින් 3,142 ක් සඳහා ගෙවනු ලැබූ රු.28,245,000 ක සහනාධාර මුදල් අදාළ ගොවීන්ගේ ගිණුම්වලට බැර නොවී වෙනත් පුද්ගලයන්ගේ ගිණුම්වලට බැර වී තිබුණි.

**(ආ)** 2016 වර්ෂයේ කන්න දෙකම සඳහා මෙන්ම 2017 යල කන්නය සඳහා එකතුව රු.බිලියන 5.48 ක් අදාල කන්න තුන සඳහා සහනාධාර මුදල් ගෙවිය යුතු කාල සීමාව ඉක්මවීමෙන් පසු ගෙවා තිබුණි. මෙම ප්‍රමාදය නිසා ගොවීන්ට නියමිත කාල වකවානුවලට කුඹුරු සඳහා පොහොර යෙදීමට නොහැකි වී තිබුණි.

(ඇ) කොළඹ විශ්වවිද්‍යාලයෙහි පරිගණක අධ්‍යයන අංශයෙහි කාර්යය මණ්ඩලය නියෝජනය කරනු ලබන බාහිර පාර්ශවයක් විසින් පොහොර සහනාධාර මුදල් ගොවීන්ගේ ගිණුම් වෙත බැර කිරීමෙහි කාර්යය කරනු ලබන අතර, මේ සම්බන්ධයෙන් පොහොර ලේකම් කාර්යාලයේ අධීක්ෂණය හා මැදිහත්වීම අවම මට්ටමක පැවතුණි.

(ඈ) කුඹුරු පොහොර සහනාධාර මුදල් නිකුත් කිරීම ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා හඳුන්වා දුන් පරිගණක පද්ධති පරීක්ෂා කිරීමේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පරිගණක දත්ත පහසුකම් ඇති කර ගැනීමේ ක්‍රියාවලියට අදාළව ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් ඇති කළ යුතු පහසුකම් සහ ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම යන මූලික අවශ්‍යතා සපුරා නොගෙන මෙම වැඩසටහන 2017/2018 මහ කන්නය සඳහා පොහොර සහනාධාර මුදල් ගෙවීමේදී උපයෝගී කර ගෙන තිබුණි.

(ii) මෙම නව පරිගණක වැඩසටහන යටතේද නියැදි පරීක්ෂාවට ලක් වූ මාතලේ අළුගොල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ගොවීන් 985 දෙනෙකුට රු.මිලියන 4.83 ක සහනාධාර මුදලක් වැඩිපුර ගෙවා තිබුණු අතර, රු.මිලියන 375.7 ක වියදමකින් ස්ථාපිත නව පරිගණක පද්ධතිය තුලින්ද පොහොර සහනාධාර මුදල් ගෙවීමේ අඩුපාඩු මගහැරීමට අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 275 ක ප්‍රතිපාදන මත ගම්මාන 2,000 ක් ආවරණය වන පරිදි පළතුරු ගම්මාන වැඩසටහනක් යටතේ පලතුරු පැල මිලියන 2 ක පමණ ප්‍රමාණයක් වගා කිරීමට සැලසුම්කර තිබුණු අතර, පළතුරු පැල සපයා ගැනීමේ ක්‍රමෝපායන් පිළිබඳව අවධානය යොමු නොකර අදාල වැඩසටහන සැලසුම් කිරීම හේතුවෙන් රු.මිලියන 70.65 ක වියදමින් ගම්මාන 207 ක පැල 251,675 ක් පමණක් සිටුවා තිබුණි.

(ඊ) අමාත්‍යාංශය විසින් රු.මිලියන 80 ක ප්‍රතිපාදන මත කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීම අරමුණු කරගෙන "සාර ලංකා" ණය යෝජනා ක්‍රමයක් ගොවි බැංකු හරහා මුළු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කර තිබුණු අතර, ප්‍රදානය කල ණය ප්‍රමාණය රු.මිලියන 27.65 ක් වූයෙන් ණය දීමේ ප්‍රගතිය සියයට 35 ක මට්ටමක පැවතුණි.

(උ) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වූ පශ්චාත් අස්වැන්න පිළිබඳව තාක්ෂණ ආයතනය මඟින් රු.මිලියන 5.35 ක් වැයකර කෘෂි බෝග වර්ග 07 ක බැරලෝහ වර්ග 04 ක් අන්තර්ගතව තිබේදැයි සහ එසේ අන්තර්ගතව ඇත්නම් ඒ කිනම් සාන්ද්‍රණයකින්ද යන්න පරීක්ෂා කර අදාල සියළුම පාර්ශවයන්ට ඒ පිළිබඳ දැනුවත්භාවය ලබා ගැනීම සඳහා නිරීක්ෂණ වාර්තාව යොමු කර ව්‍යාපෘතියේ අරමුණ ඉටු වන ආකාරයට කටයුතු කර නොතිබුණි.

තවද අදාල වැඩසටහන 2017 සහ 2018 යන වර්ෂ දෙකෙහිදී සාම්පල් 500 බැගින් සාම්පල් 1000 ක් පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබුණද 2017 වර්ෂයේ සාම්පල් 500 ක් පමණක් පරීක්ෂා කර වැඩසටහන අතහැර දමා තිබූ අතර, මෙහි එක් සාම්පලයක් පරීක්ෂා කිරීම සඳහා රු.10,700 බැගින් සාම්පල් 500 සඳහා රු.මිලියන 5.35 ක් ගෙවා තිබුණද සත්‍ය වශයෙන් පශ්චාත් අස්වනු පිළිබඳ තාක්ෂණ ආයතනය මේ සඳහා වැයකර තිබුණේ රු.මිලියන 1.96 ක් පමණි.

(ඌ) 2016 වර්ෂයේ වාහනයකට සිදු වූ රු.මිලියන 6 ක පූර්ණ හානිය මු.රෙ. 104(4) පරීක්ෂණ වාර්තාවේ නියම කර ඇති පරිදි වාහනය භාර නිලධාරියාගෙන් හා රියදුරුගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.9 මුදලට අගය විගණනය**

-------------------------

2015 මැයි 20 දිනැති අංක 11/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6 ජේදයේ දක්වා ඇති පරිදි නිල උත්සව සංවිධානය කිරීමේදී සරල හා චාම් ලෙස එම උත්සව සංවිධානය කිරීමට පියවර ගත යුතු වුවද, රු.මිලියන 38.07 ක වියදමින් දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීමේ වැඩසටහනක් ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණු අතර, මාතෘකාවට අදාලව සිදුකර තිබුණේ කෙටි දේශනයක් පමණි. රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ද අනුගමනය කිරීමකින් තොරව වේදිකාව නිර්මාණය කිරීම සඳහා රු.මිලියන 3.6 ක් පුද්ගලික ආයතනයක් වෙත ගෙවීම් කර තිබුණි. තවද "කඳුළ" නමින් පැවැත්වීමට සැලැසුම්කර තිබුණු වැඩසටහන පැවැත්වීමට නොහැකි වුවද, ඒ සඳහා රු.515,000 ක් වැයකර තිබුණි.

## 2.10 මහජනයා වෙත සේවා ඉටු කිරීම

----------------------------------

අමාත්‍යාංශය තුල මහජන පැමිණිලි භාර ගැනීම සඳහා පැමිණිලි පෙට්ටියක් පරිහරණය නොකරන අතර, පැමිණිලි භාර ගැනීම සඳහා ලේඛනයක් පවත්වා ගත්තද මෙය ප්‍රදර්ශනය කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. එමෙන්ම අමාත්‍යාංශ වෙබ් අඩවිය මඟින්ද මහජනයාගෙන් පැමිණිලි භාර ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙලකර නොතිබුණි.

## 2.11 කාර්යභාර්යයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

----------------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුල අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳව තොරතුරු හා ඒ පිළිබඳව විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 561.28 | 558.28 | 3.00 | 0.50 |
| | මූලධන | 1,268.35 | 764.30 | 504.05 | 39.74 |
| | **එකතුව** | **1,829.63** | **1,322.58** | **507.05** | **27.71** |
| 2014 | පුනරාවර්තන | 35,857.93 | 32,744.01 | 3,113.92 | 8.68 |
| | මූලධන | 872.59 | 834.39 | 38.20 | 4.38 |
| | **එකතුව** | **36,730.52** | **33,578.40** | **3,152.12** | **8.58** |
| 2015 | පුනරාවර්තන | 53,819.66 | 53,017.92 | 801.74 | 1.45 |
| | මූලධන | 1,188.06 | 712.96 | 475.10 | 40.00 |
| | **එකතුව** | **55,007.72** | **53,730.88** | **1,276.84** | **2.32** |
| 2016 | පුනරාවර්තන | 39,847.22 | 32,497.06 | 7,350.16 | 18.45 |
| | මූලධන | 5,123.11 | 2,248.61 | 2,874.50 | 56.11 |
| | **එකතුව** | **44,970.33** | **34,745.67** | **10,224.66** | **22.74** |
| 2017 | පුනරාවර්තන | 38,829.39 | 38,303.28 | 526.11 | 1.35 |
| | මූලධන | 7,872.77 | 3,338.98 | 4,533.79 | 57.59 |
| | **එකතුව** | **46,702.16** | **41,642.26** | **5,059.90** | **10.83** |

උක්ත තොරතුරු අනුව 2014 වර්ෂය හැරුණු විට පසුගිය වසර 05 තුල භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන වියදම් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන වලින් සැලකිය යුතු ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි. ඊට අමතරව 2017 වර්ෂය වෙනුවෙන් සලසන ලද ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 262.15 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 69 ක් සඳහා එකතුව රු.මිලියන 6,733.48 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 2,449.14 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 93 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ඇ) ප්‍රතිපාදන උපයෝජනය**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත කුඩා වැව් 1,500 ක රොන්මඩ ඉවත් කිරීම, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් ගොවිබිම් සඳහා වැඩි ජල ධාරිතාවක් ලබාදීම හා එල්ලංගා වැව් වැඩිදියුණු කිරීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 3,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, ඉන් රු.මිලියන 526.18 ක් පමණක් වියදම්කර තිබුණි. ඒ සම්බන්ධයෙන් මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2016 සැප්තැම්බර් 08 දිනැති අංක MNPEA 03/2016 දරන චක්‍රලේඛය, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2017 ජුනි 21 දිනැති අංක 7/2017 චක්‍රලේඛය හා කොන්ත්‍රාත් ගිවිසුම අනුව තරඟකාරිත්වයෙන් තොරව ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත්, ගිවිසුම් අත්සන් කළ ගොවි සංවිධාන විසින් උප කොන්ත්‍රාත් නොදිය යුතු වුවත්, මාතලේ දිස්ත්‍රික්කයේ ගොවි සංවිධාන 16 ක් විසින් 2017 වර්ෂයට අදාළව කොන්ත්‍රාත් වටිනාකම රු.35,844,307 වූ කර්මාන්ත 18 ක් සියයට 5 කොමිස් මුදලකට යටත්ව උප කොන්ත්‍රාත් දී තිබුණි.

(ii) දඹුල්ල ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ රු.2,519,640 ක වියදමකින් තිත්තවැල්ගොල්ල පංචව ගැඹුරු කිරීමේ කොන්ත්‍රාත්තුවේදී වැව් බැම්මේ මීටර 0.30 ඝණකමින් යුතුව පස් ඉවත් කර ඒ මත තණ පිඩලි අල්ලා ජලය යෙදීම වෙනුවෙන් රු.141,360 ක් වැයකර තිබුණු නමුත් 2017 ඔක්තෝබර් 31 දින වන විටත් තණ පිඩලි අල්ලා නොතිබුණි.

(iii) පළාපත්වෙල ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ රු.1,737,850 ක වියදමකින් රත්මල් ගහ කොන්ක්‍රීට් ඇළ වේල්ල මීටර් 03 ක් උසට ඉදිකල යුතු වුවත්, වේල්ලේ සම්පූර්ණ උස මීටර් 2.2 ක් බව 2017 ඔක්තෝබර් 31 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය වීය. ඒ අනුව අත්තිවාරම සඳහා සහ කොන්ක්‍රීට් සඳහා පිළිවෙලින් රු.396,015 ක් හා රු.34,312 ක් වශයෙන් එකතුව රු.430,327 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) කිඹිස්ස ගොවිජන සේවා බල ප්‍රදේශයේ ඇහැටුල්ලා වැවේ සොරොව්ව අළුත්වැඩියා කිරීම සහ දකුණු බැම්මේ සොරොව්ව ඉදිකිරීම සඳහා එකතුව රු.368,277 ක් ගෙවා ඇතත්, එම වැඩ කොටස් ඉටුකර නොතිබුණි.වැව් බැම්මේ හෙක්ටයාර් 2.40 ක ලඳු කැළය මුල් උදුරා රක්ෂිතයෙන් ඉවත් කිරීම වෙනුවෙන් රු.89,078 ක් ගෙවා තිබුණද එම වැඩ කොටස් ඉටුකර නොතිබුණි.

තවද වැව් බැම්මේ මතුපිට පස් මිලි මීටර 75 ක ඝණකමින් යුතුව පස් ඝණ මීටර 377 ඉවත් කිරීම, වැව් බැම්ම මත පස් අතුරා ජලය දමා තැලීම සහ වැව් බැම්ම මත තණ පිඩලි ඇතිරීම වෙනුවෙන් එකතුව රු.2,128,400 ගෙවා තිබුණද නිසිපරිදි එම කාර්යයන් ඉටුකර නොතිබූ බැවින් වැව් බැම්මේ ස්ථාන 05 ක් දිග මීටර 20, 08, 18, 19, 10 වශයෙන් ගිලා බැස තිබුණි.

(v) ගෙදරවෙල ගමේවැව කෘෂි මාර්ගය රු.1,905,545 ක වියදමින් ප්‍රතිසංස්කරණය කර තිබුණු අතර, කොන්ක්‍රීට් ඝණ මීටර 46.50 ක් සඳහා ගෙවීම් කර ඇතත්, මැනුම් කිරීමේදී යොදා තිබුණු කොන්ක්‍රීට් ප්‍රමාණය ඝණ මීටර 37.64 ක් විය. මේ අනුව කොන්ක්‍රීට් කියුබ් 8.86 ක් සඳහා රු.143,178 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(vi) තිඹිරිගස්වැව රු.3,207,383 ක වියදමින් ප්‍රතිසංස්කරණය කිරීමේදී වැව් බැම්ම මත මිලිමීටර 150 ක් පස් දමා තැලීම සඳහා රු.2,335,290 ක් ගෙවීමට නිර්දේශ කර තිබුණද, 2017 මාර්තු 08 දින සිදුකල විගණන පරීක්ෂාවට අනුව එම කාර්යයන් සිදුකර නොතිබුණි. වැවෙන් ඉවත් කල පස් හා රොන්මඩ වලින් කොටසක් වැව් බැම්මට ආසන්නයෙන් ගොඩ ගසා තිබුණ අතර එම පස් නැවත වැව තුලට සෝදා එමින් පැවතුණි.

(vii) ඉදිගස්වැව රු.2,232,039 ක වියදමින් ප්‍රතිසංස්කරණය කිරීමේදී වැව් ඉස්මත්තේ ගැඹුරෙන් පස් කපා, තට්ටු වශයෙන් දමා ජලය යොදා තැලීම වෙනුවෙන් රු.1,272,480 ක මුදලක් ගෙවීම සඳහා නිර්දේශ කර තිබුණද පස් තැලීමක් සිදු කර නොතිබුණු අතර, ඒ හේතුවෙන් පස් තට්ටුව වැවට ගලා යාමෙන් තිබුණු තත්ත්වයට වඩා අයහපත් තත්ත්වයකට මුහුණපා තිබුණි. වැව් බැම්මේ පිඩැලි ඇල්ලීම සඳහා රු.216,240 ක් ගෙවීමට නිර්දේශ කර තිබුණද එම කාර්යය සිදුකර නොතිබුණි.

(viii) මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන කාරක සභා 3 ක නියැදි පරීක්ෂාව සඳහා තෝරාගත් කර්මාන්ත 29 කින් කොන්ත්‍රාත් මිල එකතුව රු.40,667,671 ක් වූ ව්‍යාපෘති 24 ක් සඳහා ගොවි සංවිධානවල මුදල් උපයෝජනය කර නොතිබූ බව ගොවි සංවිධාන සතු බැංකු ගිණුම් පරීක්ෂාවේදී අනාවරණය වූ බැවින් අදාල ව්‍යාපෘතීන් ඉටුනොකර උප කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉටුකරගෙන ඇති බව අනාවරණය විය.

(ix) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2016 සැප්තැම්බර් 08 දිනැති අංක MNPEA 3/2016 (ප්‍රතිශෝධිත) චක්‍රලේඛය අනුව ඕනෑම අවස්ථාවක තරඟකාරිත්වයකින් තොරව ගොවි සංවිධානයකට ප්‍රදානය කළ හැකි කොන්ත්‍රාත් මිල රු.මිලියන 5 කට නොවැඩි විය යුතු නමුත් ඊට පටහැනිව මාතලේ දිස්ත්‍රික්කයේ කිඹිස්ස, හෙට්ටිපොළ හා දඹුල්ල ගොවිජන කාරක සභා බල ප්‍රදේශයන්හි ගොවි සංවිධාන 5 ක එකතු වටිනාකම රු.මිලියන 5 ඉක්මවන

ලද කොන්ත්‍රාත් මිල එකතුව රු.29,258,007 ක් වූ කොන්ත්‍රාත් 10 ක් පිරිනමා තිබුණි. තවද ඉහත චක්‍රලේඛය අනුව තරඟකාරිත්වයෙන් තොරව කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන විට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවි සංවිධානයක් ලෙස අවුරුදු 2 කට පෙර ලියාපදිංචි වී තිබිය යුතු වුවත්, ඊට පටහැනිව 2017 වර්ෂයේ ලියාපදිංචි වූ මාතලේ දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල හා කිඹිස්ස ගොවිජන කාරක සභා බල ප්‍රදේශයන්හි ගොවි සංවිධාන 4 කට එකතුව රු.14,016,365 ක් වූ කර්මාන්ත 5 ක් ප්‍රදානය කර තිබුණි.

(x) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2017 ජුනි 21 දිනැති අංක 7/2017 චක්‍රලේඛය සහ කොන්ත්‍රාත් ගිවිසුමේ 17 වැනි වගන්තිය අනුව තරඟකාරිත්වයෙන් තොරව ප්‍රදානය කරනලද කොන්ත්‍රාත් බාහිර පාර්ශවයන්ට නොපැවරිය යුතුවේ. එසේ වුවද කරල්ලියද්ද ගොවිජන කාරක සභා බල ප්‍රදේශයේ මල්උල්ල, උඩගලඋඩ හා ගලඋඩ එකමුතු ගොවි සංවිධාන පිළිවෙලින් කොන්ත්‍රාත් මිල රු.1,591,026 ක්වූ ගල්බොක්ක වැව, රු.2,292,677 ක් වූ බැදියාව වැව රු. 1,105,670 ක් වූ උඩ අස්වැද්දුම ඇළ ප්‍රතිසංස්කරණය වූ කටයුතු බාහිර පාර්ශවයන්ට සියයට 5 කොමිස් මුදලකට පවරා දී තිබුණි. තවද හඟුරන්කෙත ගොවිජන සේවා බලප්‍රදේශයේ රු.695,450 ක් වූ වැල්ලතොටඅරාව ඇළ ප්‍රතිසංස්කරණ කටයුතු දමුණුමැය ගොවි සංවිධානය විසින් බාහිර පුද්ගලයෙකුට පවරා දී තිබුණි.

(xi) කරල්ලියද්ද ගොවිජන කාරකසභා බල ප්‍රදේශයේ මල්උල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී කොන්ක්‍රීට් ඝ.මී 4.12 ක් සහ කම්බි කිලෝ ග්‍රෑම් 120 ක් සඳහා එකතුව රු.91,601 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(xii) කරල්ලියද්ද ගොවිජනකාරක සභා බල ප්‍රදේශයේ ගල්බොක්ක වැවෙහි රු.1,591,026 ක ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රමාණ පත්‍ර සකස් කිරීමේදී කාර්මික නිලධාරි විසින් වුවමනාවෙන් සාවද්‍ය මැනුම් දක්වා රු.872,042 ක අධි ඇස්තමේන්තුව පිළියෙල කර අනුමත කරවාගෙන තිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තුවේදී උස සාවද්‍ය ලෙස සටහන් කර එය උපයෝගී කරගෙන පස් ඝන මීටර් 700 ක් සඳහා රු.275,800 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 2.12 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

-----------------------------------------

සේවය හැර ගිය නිලධාරින් පස් දෙනෙකුගෙන් වසර 13 සිට වසර 20 දක්වා කාල පරාසයක් තුල අයවිය යුතු රු.268,061 ක ආපදා හා දේපල ණය ශේෂ, වසර 17 කට පෙර වැඩ තහනමකට ලක් වූ ලිපිකරුවන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.240,267 ක ආපදා හා දේපල ණය ශේෂ සහ 2009 වර්ෂයේ මියගිය නිලධාරියකුගෙන් රු.190,575 ක ණය ශේෂ මෙන්ම 2015 වර්ෂයේ විශ්‍රාම ගත් නිලධාරියකුගෙන් අයවිය යුතු රු.27,050 ක ණය ශේෂ වශයෙන් එකතුව රු.725,953 ක ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 2.13 අග්‍රිම ගිණුම

-------------

අමාත්‍යාංශයට අදාල අග්‍රිම ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.456,000 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කල යුතු වුවත්, අමාත්‍යාංශයේ නිළධාරීන් 38 දෙනෙකු ලබාගෙන තිබුණු රු.1,384,160 ක අතුරු අග්‍රිම පියවීමට දින 21 සිට දින 87 දක්වා ප්‍රමාද කර තිබුණු අවස්ථා 101 ක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 11 දෙනෙකු අවස්ථා 12 කදී ලබාගත් රු.136,439 ක තත්කාර්යය අතුරු අග්‍රිම දින 01 සිට දින 24 දක්වා කාලයක් අත රඳවාගෙන අතුරු අග්‍රිම ලබාගත් කාර්යභාර්යය ඉටු නොකර එම මුදල් ප්‍රමාණයම නැවත අමාත්‍යාංශයට ලබා දී තිබුණි.

## 2.14 පොදු තැන්පත් ගිණුම්

----------------------

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 12.8 ක් විය. වෙනත් ආයතන විසින් විවිධ කාර්යයන් සඳහා අවස්ථා 11 කදී ලබා දී තිබුණු රු.2,037,722 ක මුදල් අදාල කාර්යභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.15 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

--------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලසි 891(1) |
| (ආ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

## 2.16 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

----------------------------------------------

මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ධාවනය කල වාහන 26 කට අදාල ධාවන සටහන් හා වාහන 34 කට අදාල මාසික සාරාංශ, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.17** මානව සම්පත් කළමනාකරණය
----------------------------------
**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**
--------------------------------------------------------------------------------
ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්යමණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.657,500,480 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.487,760 ක් වී තිබුණි.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 139 | 114 | 25 | - |
| තෘතියික මට්ටම | 11 | 3 | 8 | - |
| ද්විතියික මට්ටම | 1359 | 1100 | 259 | - |
| ප්‍රාථමික මට්ටම | 153 | 127 | 26 | - |
| අනියම්/තාවකාලික | 2 | 4 | - | 2 |
| **එකතුව** | **1664** | **1348** | **318** | **2** |

අමාත්‍යාංශයේ නිලධාරීන් හා සේවකයින් 1305 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ පුහුණුවක් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

**2.18** **රජයේ නිලධාරීන්ට ඇප තැබීම**
----------------------------------
මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව ඇප තැබිය යුතු සරප්, ගබඩා භාර නිලධාරි සහ ගණකාධිකාරි යන නිලධාරීන් ඇපතබා නොතිබුණි.